# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,872 — 1969 සැප්තැම්බර් 19 වැනි සිකුරාද — 1969.9.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... ... | 121 |
| ශ්‍රෙෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රෙෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම ... ... | — | | |


## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### දකුණු පළාත

#### දම්පහල ගම්බද නඩු ශාලාවේ දී ය

බෙරලපනාතර, ගම්සභාවේ සභාපති තැන ........................................................ පැමිණිලිකාරයා

නොම්මරය : 4653

එදිරිව

එඩ්වඩ් ගුණතිලක, 45, හෙස් පාර, දෙණියාය ........................................................ විත්තිකාරයා

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් රුපියල් 158.95ක් අයකර ගැනීමට වර්ෂ 1969 ක්වූ ඔක්තෝබර් මස 27 දින පස්වරු 1ට එම ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරලේ නැගෙනහිර, කිරිලපනේ තිබෙන පින්ලන්ඩ්වත්ත කියන, උතුරට : ඉරිකොන්දහේනද, නැගෙනහිරට : කුරුදුවත්ත නොහොත් ගල්ගහහේනද, දකුණට : කොට පොලවත්තද, බස්නාහිරට : කොටපොලවත්තද මායිම් වූ අක්කර හැට එකක් විශාලකම ඇති ඉඩමේ තිබෙන තේ, රබර් සහ සියළුම ගහකොල ද, එහි තිබෙන සියළුම ගොඩනැගිලි ආදී දේපලත් වේ.

මැ. ග. වින්සන්ට්,
අතිරේක නියෝජ්‍ය පිස්කල්, මාතර.

වර්ෂ 1969 සැප්තැම්බර් මස 9 වැනි දින,
මාතර, පිස්කල් කන්තෝරුවේ දී ය.

9–691

#### ගාල්ල දිස්ත්‍රික් නඩුශාලාවේදීය.

ගාල්ලේ, ඊකොටස් සහ සමාගම (ගාල්ල) සීමාසහිත ........................................................ පැමිණිලිකාරයා.

නොම්මරය : ඇ.මු. 3450

එදිරිව

වරල්ලේ, යාප්ලන්ඩ් හි, මැන්ඩිස් දහනායක යාපා ........................................................ විත්තිකාරයා

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රු. 1,38,130.17 සහ 66.11.12 (නඩුතීන්දු දිනය) සිට 5% නීති පොලියද, නඩු ගාස්තුද, (ගාස්තු පසුවට තබන ලදී.) අයකර ගැනීම පිණිස වර්ෂ 1969 ක් වූ ඔක්තෝබර් මස 29 වැනි දින, පෙ.ව. 10.00 ට මාතර, පිස්කල් කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

පහත විස්තර වන යප්ලන්ඩ් සහ වරල්ල වතුයායේ ඉඩම් හා වැවිලි, කර්මාන්ත ශාලා හා වෙනත් ගොඩනැගිලිවලින් මැන්දිස් දහනායක යාපා නමැති විත්තිකරුට අයත් සියළුම හිමිකම් උරුම හා අයිතිවාසිකම ද වේ.

1. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ පල්ලේ පත්තුවේ කොපොල පිහිටි උතුරට : හිමිකම් පිඹුරු අංක 94952 සඳහන් රජය සතු ඉඩම (ඊටත් වැඩියෙන් නිවැරදි ලෙස අංක 1ඒ දරණ කැබැල්ල සහ රජය සතු ඉඩම්) ; නැගෙනහිරට : තහනම් බිම් තීරය සහ මහ පාර (ඊටත් වැඩියෙන් නිවැරදි ලෙස රජය සතු ඉඩම) හන්ගරන්කන්ද නමැති ඉඩම සහ හිමිකම් පිඹුරු අංක 94952 සඳහන් තහනම් බිම් තීරය ; දකුණට

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

සහ බස්නාහිරට : එම ඉඩමේ අංක 1ඒ දරණ කැබැල්ල (ඊටත් වැඩියෙන් නිවැරදි ලෙස දකුණට : පාර සහ පාර දිගට තහනම් බිම් තීරය සහ බස්නාහිරට : පාර දිගට තහනම් බිම් තීරය සහ අංක 1ඒ දරණ කැබැල්ල) යන මායිම් තුල අක්කර 12, රූඩ් 3, පර්චස් 2ක් විශාල හන්ගරන් කන්ද සහ වෙරනියහේන වත්ත නොහොත් වරල්ල ඇස්ටේට් නමැති ඉඩමේ 1බී සහ 3 දරණ ඒකාබද්ධ කැබැලි වේ.

2. ඉහතකී කොටපොල පිහිටි උතුරට : වතුර පාර, ටී. පී. 94940 සහ තහනම් බිම් තීරය ; නැගෙනහිරට : මහපාර ; දකුණට : ටී. පී. 95059 සහ වතුර පාර ; බස්නාහිරට : ගැතබරුකන්ද නමැති රජය සතු ඉඩම යන මායිම් තුල අක්කර 11, රූඩ් 3, පර්චස් 9 ක් විශාල ලින්දගාවහේන නොහොත් වරල්ල ඇස්ටේට් නැමැති ඉඩමේ අංක 4, 5 සහ6 දරණ ඒකාබද්ධ කැබැලි වේ.

3. ඉහතකී කොටපොල පිහිටි උතුරට : එම ඉඩමේ අංක 11 දරණ කැබැල්ල සහ පී.පී. 815 සඳහන් කිව්. 331 දරණ කැබැල්ල ; නැගෙනහිරට සහ දකුණට : රජය සතු කැලේ ; බස්නාහිරට : එම ඉඩමේ අංක 18 සහ 11 දරණ කැබැලි යන මායිම් තුළ අක්කර 2, රූඩ් 2, පර්චස් 37 ක් විශාල කඩුලුහේන නොහොත් කුඩලුහේන නොහොත් වරල්ල ඇස්ටේට් නමැති ඉඩමේ අංක 12 සහ 13 දරණ ඒකාබද්ධ කැබලි වේ.

4. ඉහතකී කොටපොල පිහිටි උතුරට සහ බස්නාහිරට : මහ පාර ; නැගෙනහිරට : රජය සතු කැලේ ; දකුණට : පාරට තහනම් බිම් තීරය සහ පී.පී. 815 සඳහන් කිව් 331 දරණ කැබැල්ල යන මායිම් තුළ අක්කර 2, රූඩ් 2, පර්චස් 15 ක් විශාල කඩලුහේන නොහොත් කුඩලුහේන නොහොත් වරල්ල ඇස්ටේට් නමැති ඉඩමේ අංක 14 දරණ කැබැල්ල වේ.

5. ඉහතකී කොටපොල පිහිටි උතුරට : ටී.පී. 95060 සහ වතුර පාර ; නැගෙනහිරට : මහ පාර ; දකුණට : ටී. පී. 98151 ; බස්නාහිරට : රජය සතු හල්ගස් මුල්ලේ හේන සහ හන්ගරන්කන්ද නමැති ඉඩම යන මායිම් තුළ අක්කර 6, රූඩ් 2, පර්චස් 35 ක් විශාල හල් ගස් මුල්ලෙහේන නොහොත් වරල්ල ඇස්ටේට් නමැති ඉඩමේ අංක 7, 6, 9, 10 සහ 26 දරණ ඒකාබද්ධ කැබැලි වේ.

6. ඉහතකී කොටපොල පිහිටි උතුරට : එම ඉඩමේ කැබැල්ලක් (ඊටත් වැඩියෙන් නිවැරදි ලෙස අතුරු පාරක්) ; නැගෙනහිරට : රජය සතු ඉඩම ; දකුණට : වෙල්ලගේ බෙබිහාමි අයිතිකම් කියන ඉඩම ; බස්නාහිරට : මහ පාර යන මායිම් තුල අක්කර 1, රූඩ් 2, පර්චස් 21 ක් විශාල ගල්ගොඩගාවහේන නොහොත් වරල්ල ඇස්ටේට් නමැති ඉඩමේ අංක 15 දරණ කැබැල්ල වේ.

7. ඉහතකී කොටපොල පිහිටි උතුරට : හපු ආච්චිගේ දිනෙස් සහ තවත් අය අයිතිකම් කියන ඉඩම ; ටී. පී. 95061 සහ හපු ආච්චිගේ සැමුවෙල් සහ තවත් අය අයිතිවාසිකම් කියන ඉඩම ; නැගෙනහිරට : එම ඉඩමේ ම කැබැල්ලක් (ඊටත් වැඩියෙන් නිවැරදි ලෙස හපු ආච්චිගේ දිනෙස් සහ තවත් අය අයිතිකම් කියන ඉඩම ; ටී. පී. 95061 සහ හපු ආච්චිගේ සැමුවෙල් සහ තවත් අය අයිතිකම් කියන ඉඩම) ; දකුණට : මහ පාර (ඊටත් වැඩියෙන් නිවැරදි ලෙස අතුරු පාර) ; බස්නාහිරට : රජයට අයිතිය කියන ඉඩම (ඊටත් වැඩියෙන් නිවැරදි ලෙස මහ පාර) යන මායිම් තුල අක්කර 2, රූඩ් 1, පර්චස් 20 ක් විශාල ගල්ගොඩගාවහේන නොහොත් වරල්ල ඇස්ටේට් නැමැති ඉඩමේ අංක 16 සහ 17 දරණ ඒකාබද්ධ කැබලි වේ.

8. ඉහතකී කොටපොල පිහිටි උතුරට : ටී. පී. 95501, ටී. පී. 97743, අංක 21 දරණ කැබැල්ල (අත් හරින) සහ පරණ පාර ; නැගෙනහිරට : පරණ පාර, අංක 24 දරණ කැබැල්ල (අත්හරින ලද) ලොකු නයිදෙ අයිතිකම් කියන හල්ගස්මුල්ලෙහේන සහ පරණ පාර ; දකුණට : තහනම් බිම් තීරය සහ ටී. පී. 92131 සහ බස්නාහිරට : පාර සහ ටී. පී. 116059 යන මායිම් තුල අක්කර 9, රූඩ්, 0 පර්චස් 23 ක් විශාල හල්ගස්මුල්ලහේන නොහොත් වරල්ල ඇස්ටේට් නමැති ඉඩමේ අංක 22, 23 සහ 25 දරණ ඒකාබද්ධ කැබැලි වේ.

9. ඉහතකී කොටපොල පිහිටි උතුරට : ටී. පී. 155807 තේ කෙහෙල් වත්තෙදෙනිය සහ රජය සතු ඉඩම ; නැගෙනහිරට : රජය සතු ඉඩම ; දකුණට : රදල්ගෙවත්තෙදෙනිය කපා තැනුම සහ නිල්වලා ගඟ (ඊටත් වැඩියෙන් නිවැරදි ලෙස රජය සතු රදල්ගෙවත්ත, රදල්ගෙවත්තදෙනිය කපා තැනුම සහ නිල්වලා ගඟ) (ඊටත් වැඩියෙන් නිවැරදි ලෙස රදල්ගෙවත්තෙදෙනිය කපාතැනුම සහ නිල්වලා ගඟ සහ එම ඉඩමේ ඒ අක්ෂර දරණ කැබැල්ල) ; බස්නාහිරට : රදල්ගෙවත්ත සහ නිල්වලා ගඟ යන මායිම් තුල අක්කර 16, රූඩ් 1, පර්චස් 17 ක් විශාල අප්පුඅම්මගෙවත්තෙහේන, උඩ වත්තෙහේන, අඹගහදෙනියගාවහේන, ගලඋඩගහලහහේන, වීජේසිරියගෙ කුඹුරගාවහේන සහ උඩගෙදර කුඹුරලඟහේන නොහොත් වරල්ල ඇස්ටේට් (අංක 90 දරණ කපාතැනුම දරණ කැබැල්ල අත්හැර) නමැති ඉඩමේ බී අක්ෂරය දරණ කැබැල්ල වේ.

10. ඉහතකී කොටපොල පිහිටි උතුරට : අංක 2 දරණ කැබැල්ල සහ රජය සතු හන්ගරන්කන්ද ; නැගෙනහිරට : රජය සතු හන්ගරන්කන්ද ; දකුණට : අංක 1බී දරණ කැබැල්ල සහ පාර දිගට තහනම් බිම් තීරය ; බස්නාහිරට : රජය සතු හන්ගරන්කන්ද යන මායිම් තුල අක්කර 28, රූඩ් 1, පර්චස් 36 ක් විශාල හන්ගරන්කන්ද නමැති ඉඩමේ 1ඒ දරණ කැබැල්ල (ටී. පී. 4647 තේ අංක 12837, 12846 සහ 12847 දරණ කැබලි) වේ.

11. ඉහතකී කොටපොල පිහිටි උතුරට : රජය සතු හන්ගරන්කන්ද ; නැගෙනහිරට : රජය සතු හන්ගරන්කන්ද ; දකුණට : අංක 1ඒ දරණ කැබැල්ල ; බස්නාහිරට : රජය සතු ඉඩම යන මායිම් තුල අක්කර 23, රූඩ් 3, පර්චස් 18 විශාල හන්ගරන්කන්ද නමැති ඉඩමේ අංක 2 දරණ කැබැල්ල වේ. (ටී. පී. 4647 තේ අංක 12837, 12846 සහ 12847).

12. ඉහතකී මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරලේ, වරල්ලේ පිහිටි උතුරට : පාර දිගට තහනම් බිම් තීරය සහ අංක 11 දරණ කැබැල්ල ; නැගෙනහිරට : අංක 12 දරණ කැබැල්ල සහ රජය සතු කැලේ ; දකුණට : නිල්වලා ගඟ දිගට තහනම් බිම් තීරය ; බස්නාහිරට : පාර දිගට තහනම් බිම් තීරය යන මායිම් තුල අක්කර 9, රූඩ් 3, පර්චස් 11 ක් විශාල මගදෙනිය හේන (ටී. පී. 171843) නමැති ඉඩමේ අංක 18 දරණ කැබැල්ල වේ.

13. ඉහතකී කොටපොල පිහිටි උතුරට : පාර ; නැගෙනහිරට : පී.පී. 815 සඳහන් කිව් 331 දරණ කැබැල්ල සහ අංක 13 දරණ කැබැල්ල ; දකුණට : අංක 12 සහ 18 දරණ කැබැලි ; බස්නාහිරට : අංක 18 දරණ කැබැල්ල සහ පාර දිගට තහනම් බිම් තීරය යන මායිම් තුල අක්කර 1, රූඩ් 2, පර්චස් 24 ක් විශාල කඩලුහේන නොහොත් කුඩලුහේන (ටී. පී. 171798) නමැති අංක 11 දරණ කැබැල්ල වේ.

වර්ෂ 1956 දෙසැම්බර් මස 14 වෙනි දින ජේ. ඒ. වීරසිංහ, ප්‍රසිද්ධ නොතාරිස්තැන විසින් සහතික කරණ ලද අංක 133 දරණ උගස් ඔප්පුව වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික් උසාවියේ පවරා තිබෙන අංක ඇම්. බී. 6310 දරණ නඩු තීන්දුව යටතේ ගෙවිය යුතු මුදල වන රුපියල් 2,40,000 ද, වර්ෂ 1957 පෙබරවාරි මස 15 සහ 16 වෙනි දිනයන්හි ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 5314 දරණ උගස් ඔප්පුව වෙනුවෙන් මාතර දිස්ත්‍රික් උසාවියේ පවරා තිබෙන අංක ඇම්. බී. 1286 දරණ නඩුව යටතේ ගෙවිය යුතු මුදල වන රුපියල් 1,60,000 ද, වර්ෂ 1961 අප්‍රේල් මස 4 වෙනි දින ඇම්. ඇල්. ඇන්. වික්‍රමසිංහ, ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 2088 දරණ උගස් ඔප්පුව වෙනුවෙන් ගාල්ලේ දිස්ත්‍රික් උසාවියේ පවරා තිබෙන අංක ඇම්. බී. 2308 දරණ නඩුව යටතේ ගෙවිය යුතු මුදල වන රුපියල් 2,73,333.32 සහ 1966 නොවැම්බර් මස 8 වෙනි දින සිට රුපියල් 2,00,000 ට අවුරුද්දකට සියයට 8 ගණනේ පොලිය ද යන සියලුම මුදල්වලට යටත්ව විකුණනු ලැබේ.

මැ. ග. වින්සන්ට්
අතිරේක නියෝජ්‍ය පිස්කල්
මාතර.

වර්ෂ 1969 ක්වූ සැප්තැම්බර් මස
9 වැනි දින
මාතර පිස්කල් කන්තෝරුවේ දීය.

9–692

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

## උපලේඛනය

### 1969

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 69.6. 6 සිකුරාද | 69. 5.30 සිකුරාද | දවල් | 12.00 |
| | 69.6.13 සිකුරාද | 69. 6. 6 සිකුරාද | දවල් | 12.00 |
| | 69.6.20 සිකුරාද | 69. 6.13 සිකුරාද | දවල් | 12.00 |
| | 69.6.27 සිකුරාද | 69. 6.20 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූලි | 69. 7. 4 සිකුරාද | 69. 6.27 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.11 සිකුරාද | 69. 7. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.18 සිකුරාද | 69. 7.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.25 සිකුරාද | 69. 7.18 සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු | 69. 8. 1 සිකුරාද | 69. 7.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8. 8 සිකුරාද | 69. 8. 1 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.15 සිකුරාද | 69. 8. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.22 සිකුරාද | 69. 8.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.29 සිකුරාද | 69. 8.22 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 69. 9. 5 සිකුරාද | 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.12 සිකුරාද | 69. 9. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.19 සිකුරාද | 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.26 සිකුරාද | 69. 9.19 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 69.10. 2 බ්‍රහස්පතින්ද | 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.10.17 සිකුරාද | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.10.24 සිකුරාද | 69.10.17 සිකුරාද | දවල් | 12.00 |
| | 69.10.31 සිකුරාද | 69.10.24 සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | 69.11. 7 සිකුරාද | 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | 69.11.14 සිකුරාද | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.11.21 සිකුරාද | 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.11.28 සිකුරාද | 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | 69.12. 5 සිකුරාද | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.12 සිකුරාද | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 69.12.19 සිකුරාද | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.26 සිකුරාද | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

එල්. ඩබ්ලිව්. ජී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි